# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

### ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි ප්‍රථම පරීක්ෂණය (බාහිර) - 2023
### 2025 අගෝස්තු / සැප්තැම්බර්

### සමාජීය විද්‍යා පීඨය

## ආර්ථිකවිද්‍යාව

### ආර්ථිකවිද්‍යා මූලධර්ම - ECON 18214

කැමති ඕනෑම ප්‍රශ්න පහකට (05) පිළිතුරු සපයන්න.

**ප්‍රශ්න සංඛ්‍යාව : 10 යි.** **කාලය : පැය 03 යි.**

---

01. ආර්ථිකවිද්‍යා විෂයෙහි කාර්යභාරය කුමක්ද යන්න එහි ආරම්භය හා විකාශය සහ විශ්ලේෂණ විධි ක්‍රම ඇසුරෙන් විමසන්න. (ලකුණු 20)

02. අ) ආර්ථිකවිද්‍යාඥයන් විසින් 'හිඟකම' හා 'තේරීම' පොදු ගැටලුවක් වශයෙන් හඳුන්වන්නේ ඇයි ද? යන්න පරීක්ෂා කරන්න. (ලකුණු 10)

ආ) වෙළෙඳපොල ආර්ථික පද්ධතියක සම්පත් බෙදා වෙන් කරලීමේ ප්‍රශ්න විසඳා ගන්නා ආකාරය කාර්යක්ෂම නිමැවුම සංකල්පය ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 10)

03. කල්පිත භාණ්ඩයක් සඳහා වෙළෙඳපොල ඉල්ලුම් සහ සැපයුම් සමීකරණ පහත දැක්වේ.

$$Qd = 600 - 3P \quad \text{හා} \quad Qs = -100 + 2P$$

ඉහත සමීකරණ භාවිතයෙන්:

අ) මෙම භාණ්ඩයේ වෙළෙඳපොල සමතුලිත මිල හා ප්‍රමාණය ගණනය කරන්න. (ලකුණු 04)

ආ) වෙළෙඳපොල සමතුලිතයේ දී පාරිභෝගික අතිරික්තය සහ නිෂ්පාදක අතිරික්තය ගණනය කරන්න. (ලකුණු 04)

ඉ) මෙම භාණ්ඩය සඳහා රජය විසින් ඒකකයකට රුපියල් 10 ක පිහිටාධාරයක් ලබාදෙන්නේ නම් නව වෙළෙඳපොල සමතුලිත මිල හා ප්‍රමාණය ගණනය කරන්න. (ලකුණු 06)

ඊ) ආනයන තීරු බද්දක් පැනවීමේ දී ඇති කෙරෙන ප්‍රතිවිපාක රූප සටහනක් මගින් පැහැදිලි කරන්න. (ලකුණු 06)

04. පහත ඒවා කෙටියෙන් පහදන්න.

අ) වෙළෙඳපොල ආර්ථිකයක රජයේ කාර්යභාරය
ආ) ආර්ථික අරමුණු සහ යෝග්‍යතාව
ඉ) ඉල්ලුම් නම්‍යතාව ගණනය කිරීමේ ඇති වැදගත්කම
ඊ) මිල අපේක්ෂිතා නම්‍යතාව (ලකුණු 05 බැගින්)

05. අ) විචල්‍ය සාධක අනුපාත නියමය තුළින් ප්‍රකාශ කෙරෙනුයේ කුමක්ද? (ලකුණු 06)

ආ) ආයතනයක කෙටිකාලීන සාමාන්‍ය නිමැවුම් වක්‍රය සහ ආන්තික නිමැවුම් වක්‍රය අතර පවත්නා සම්බන්ධය උචිත ක්‍රම භාවිතයෙන් පෙන්වන්න. (ලකුණු 06)

ඉ) ආයතනයක අභ්‍යන්තර හා බාහිර පිරිමැසුම් සහ නොපිරිමැසුම් මොනවාද? යන්න පිරිවැය න්‍යාය ආශ්‍රයෙන් සාකච්ඡා කරන්න. (ලකුණු 08)

06. අ) අයබාර වක්‍ර සහ පිරිවැය වක්‍ර ආශ්‍රයෙන් නිෂ්පාදන ආයතනයක කෙටිකාලීන ලාභ උපරිම කෙරෙන ආකාරය උචිත රූප සටහනක් මගින් පහදන්න. (ලකුණු 06)

ආ) ප්‍රත්‍යක්ෂ පිරිවැය සහ ආරෝපිත පිරිවැය අතර වෙනස දක්වන්න. (ලකුණු 04)

ඉ) පිරිවැය න්‍යාය අනුව සාමාන්‍ය පිරිවැය වක්‍ර "U" හැඩයක් සහ "L" හැඩයක් ගනු ලබන්නේ ඇයි ද? යන්න පෙන්වා දෙන්න. (ලකුණු 10)

07. අ) පූර්ණ තරඟකාරී ආයතනයක වෙළෙඳපොල අලෙවි මිල තීරණය කෙරෙන ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 05)

ආ) පූර්ණ තරඟකාරී ආයතනයක් කර්මාන්තයෙන් ඉවත් නොවී රැඳී සිටීමේ කොන්දේසිය කුමක්ද? යන්න පෙන්වා දෙන්න. (ලකුණු 05)

ඉ) ඒකාධිකාරී වෙළෙඳපොලක් බිහිවීම සඳහා බලපාන සාධක මොනවාද? (ලකුණු 05)

ඊ) ඒකාධිකාරී ආයතනයක භාණ්ඩ මිල තීරණය වීම හා එකී භාණ්ඩයේ මිල ඉල්ලුම් නම්‍යතාව අතර පවත්නා සම්බන්ධය කුමක් ද? යන්න රූපසටහනක් ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 05)

08. අ) 'භාණ්ඩ අතරමැදිකරණය' සහ 'මූල්‍ය අතරමැදිකරණය' යනුවෙන් අදහස් කෙරෙන්නේ කුමක් ද? යන්න එහි විකාශය ඇසුරෙන් විමසන්න. (ලකුණු 10)

ආ) ශ්‍රී ලංකා මහ බැංකුවට පැවරී ඇති කාර්යභාරය කුමක් ද? යන්න පැහැදිලි කරන්න. (ලකුණු 10)

09. අ) දළ දේශීය නිෂ්පාදිත සහ දළ ජාතික නිෂ්පාදිතය නිර්වචනය කර ඒවා අතර පවත්නා වෙනස්කම් මොනවා ද? යන්න පෙන්වන්න (ලකුණු 10)

ආ) 'ආර්ථික අවබෝධය සහ ආර්ථික විශ්ලේෂණය සඳහා ජාතික ගිණුම් දත්ත ඉතා ප්‍රබල උපකරණයක් වේ.'' මෙම ප්‍රකාශය පැහැදිලි කරන්න. (ලකුණු 10)

10. කැමති හතරකට (04) කෙටි සටහන් ලියන්න.

i. ආවස්ථික පිරිවැය
ii. කාර්යක්ෂම නිමැවුම
iii.ශුද්ධ පොදු භාණ්ඩ
iv. අහිමිවන සුබසාධනය (deadweight loss)
v. ජාතික ආදායම් ගුණකය
vi. ආර්ථික වර්ධනය සහ සංවර්ධනය (ලකුණු 05 බැගින්)

******************************